# <u>ශ්‍රී ලංකාවේ මල රොන්මඩ කලමනාකරණය වැඩි දියුණු කිරීම</u>

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සමඟ එක්ව JICA ආයතනයේද සහය ඇතිව මල රොන්මඩ කලමනාකරණ වැඩිදියුණු කිරීම කෙරෙහි අවදානය යොමු කරමින් සංකල්ප පත්‍රයක් පිළියෙල කොට ඇත. මෙහි සමස්ථ අරමුණ වනුයේ, අදාළ කලාපවල දේශීය පසුබිම හා කාලගුණික තත්වයන් සඳහා සුදුසු වන අන්දමෙන් තිරසර මල රොන්මඩ කලමනාකරණයේ මනා භාවිතයක් ප්‍රචාරය කිරීමයි. වැඩබිම්වල විවිධ සාධක කෙරෙහි නිසි අවදානය යොමු කිරීමටත්, අදාල රෙගුලාසි පාදක කරගත් පරිසරයක් සක්‍රීය කරගැනීමටත්, තිරසර ස්ථානීය සනීපාරක්ෂක සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රමිතීන් සකස් කිරීමටත්, ප්‍රමුඛ ක්‍රියාකාරකම් තුලින් මනා භාවිතයන් හඳුනාගැනීමට අපේක්ෂා කෙරේ.

මෙම රැස්වීම් වාර්තා සඳහා 2024 ජුලි මස 4 වැනි දින ශ්‍රී ලංකා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් ප්‍රදීප් යසරත්න මහතා විසින් අමාත්‍යාංශය වෙනුවෙන්ද, විස්තරාත්මක සැලසුම් සමීක්ෂණ කණ්ඩායමේ නායකයා ලෙස JICA ආයතනය වෙනුවෙන් යොෂිඩා කෙන්ටාරෝ මහතා විසින්ද අත්සන් තබන ලදී.





